# වහල්බවේ ගමන්මග 6
# සිංහලය ශ්‍රී ලංකාව වීම

**1539 නොවැ. 26:**

සිංහලය මුළුමනින්ම අල්ලා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් පෘතුගීසි සෙන්පති මිගෙල් පෙරේරා තම රජතුමාට වාර්තාවක් සපයයි.

මායාදුන්නේට එරෙහිව සටන් කිරීමට බුවනෙකබා රජු වෙත පෘතුගීසීන් විසින් තම දකෂ සෙන්පතියකු වූ පෙරදිග පිළිබඳ පළපුරුද්දක් සහිතවූ විශේෂයෙන්ම සිංහලය ගැන දැනුමක් සහිතවූ මිගෙල් පෙරේරා එවනු ලැබීය. ඔහු විසින් පෘතුගාල රජතුමාට ඉදිරිපත් කළ මේ වාර්තාවේ සාරාංශය වූයේ සිංහලයට ගොඩ බැස වසර 35 ක් ගත වුවත් එය අල්ලා ගැනීමට නොහැකිවීම පිළිබඳව පෙර සිටි හමුදා නායකයන් විවේචනය කිරිමය. මීට අමතරව "මෙහි ඇති කුරුඳුවල සුවඳ දැනටමත් අන්‍ය යුරෝපීය ජාතීන්ට දැනෙන්නට පටන්ගෙන තිබේ. මේ රට පෘතුගීසීන් අතට ගතහොත් කොතරම් අගනේද?" යනුවෙන් තම හමුදාවේ ආධිපත්‍ය සිංහලයේ තහවුරු කර ගැනීමට බටහිරින් එන අභියෝග පිළිබඳවද ඔහු කරුණු දක්වා තිබේ.

**1540 නොවැ 11:**

සිංහලයේ අනාගත රජතුමා පිළිබඳව ගෝව ප්‍රතිරාජයා විසින් පෘතුගාල රජුට තොරතුරු දන්වා යවයි.

සිංහලයේ රජු ගැන ඔබතුමා මට ලියා එවූ හැම අණක්ම මම ඉටු කළෙමි. තවද ඔහුගේ සහෝදරයාත් මුණුබුරාත් පිළිබඳව ඔබතුමාගේ ආඥාව මම ඔහුට දැන්වූවෙමි. ... ඔහුගෙන් පසු ඔහුගේ සහෝදරයා රජවීම වැළැක්වීමට සෑම උත්සාහයක්ම යෙදිය යුතු යැයි ඔබතුමා දන්වා එවා තිබුණි. ඔහුගෙන් පසු මුණුබුරා රජකමට පත්කළහොත් ඔහු ඔබතුමාගේ මිනිසුන්ගේ රැකවරණය යටතේ තැබීම ප්‍රඥාගෝචර යැයි සිතේ. රජුගෙන් පසු නිත්‍යානුකූලව රජවිය යුත්තා ගැන ඔබතුමා අසා එවා තිබේ. මලබාරයේ මේ රජුගෙන් පසු සහෝදරයා හෝ බෑණා රජකමට පත් කෙරුණද මෙහි එවකට බලවත්ව සිටිය තැනැත්තා රජවිය හැකිය" යනුවෙන් එම ලිපියේ සඳහන් වෙයි.

**1541 අගෝස්තු :**

තමාගෙන් පසු රජකමේ උරුමය මුණුබුරු ධර්මපාල කුමරුට ලබාදෙන සෙ ඉල්ලමින්, ඇත් දත් හා රන් උපයෝගි කරගෙන නිමවූ ධර්මපාල කුමාරයාගේ ප්‍රතිමාවක් බෞතිස්මය සඳහා බුවනෙකබා රජු විසින් විශේෂ සන්දේශයක් සහිතව දූත පිරිසක් සමග පෘතුගාලයේ, ලිස්බනයට යවනු ලබයි.

තමාගෙන් පසු මුණුබුරු ධර්මපාල අභිෂේකලාභියා බවට පත් කිරීම පමණක් මෙම දූත ගමනේ අරමුණ නොවීය. එවකට කෝට්ටේ රාජධානිය තුළ පැලපදියම්ව සිටි පෘතුගාල නිලධාරීන්ගේ රාජද්‍රෝහී, නීති විරෝධී ක්‍රියා පිළිවෙත පිළිබඳව පෘතුගාල රජු දැනුවත් කිරීමද එහි අරමුණක් විය. මෙම සන්දේශය තුළ පෘතුගාලයෙන් මිෂනාරිවරුන් ආගම ප්‍රචාරය සඳහා එවන ලෙසද ආරාධනා කර තිබුණි.

**1542:**

ෆ්‍රැන්සිස් ක්ෂේවියර් පාදිලිතුමා ගෝවට පැමිණෙයි.

ඔහු විසින් එම වසරේදීම මන්නාරම් වැසියන් ක්‍රිස්තියානියට හරවා ගැනීම ආරම්භ කරන ලදී.

1542 :

රයිගම් බණ්ඩාර රජු මිය යයි. එම පාලන ප්‍රදේශය මායාදුන්නේ තමන්ගේ යටත් ප්‍රදේශයක් බවට පත් කරගනියි.

1542 අගෝස්තු:

මහනුවර සාමන්ත පාලකයා වූ ජයවීර පෘතුගීසි සහාය අපේක්ෂා කරයි.

1543 පෙබරවාරි:

පෘතුගීසි සේනාවක්, ජයවීරට සහය ලබාදීම පිණිස තිරිකුණාමලයට පැමිණෙයි.

1543 :

ධර්මපාල කුමරුගේ පිළිරුව පෘතුගාල රජු අතින් අභිෂේක ලබයි.

ශ්‍රී රාධා රක්ෂ පණ්ඩිත හා සල්ලපුආරච්චි යන ප්‍රභූන් දෙදෙනා ප්‍රධාන පිරිසක් මේ සඳහා එක්ව සිටියහ. දූත පිරිස පෘතුගාලයේ තුන්වන ජුවන් රජු විසින් සාදරයෙන් පිළිගන්නා ලදී. "පුතුන් සිය පියා ඇවෑමෙන් රජු බවට පත්වීම යට කී (සිංහලයේ) සිරිත බව යටකී ධර්මපාල, ඔහුගේ (බුවනෙකබා රජුගේ) මුණුබුරා එනම්, දියණියන්ගේ පුතු බවත් ඔහු විනා යටකී රජුට අන්කිසි පුතෙකු හෝ මුණුබුරකු හෝ නැති බවත් එහෙයින් යටකී සිරිත පරිදි රාජ්‍යය හිමි විය යුත්තේ එම මුණුබුරාට බවත් අද දවසේ ඔහුගේ මුත්තණුවන් කරනා සේ එම රාජ්‍යය තමන් සතුකොට භුක්ති විඳිය යුතු බවත් මෙයින් ප්‍රකාශ කරමි. යනුවෙන් එහිදී ආඥාවක් නිකුත් කළ ජුවාන් රජු පෘතුගාල රාජ සභාවේ දී සිය සභිකයන්ගේ අත්පොළසන් ප්‍රීති ඝෝෂා මැද ධර්මපාල කුමරුගේ පිළිරුවට සියතින්ම රන් කිරුළ පළඳවනු ලැබීය.

ජුවාන් රජුගේ දෙවන ආඥාවක් මගින් රජවාසල මහ නිලමේ පදවිය හෙවත් අගමැති තනතුරද බුවනෙකබාහු රජුගේ ඇවැස්ස බෑණා වූ තම්මිට සූරිය බණ්ඩාර හා ඔහුගේ පරපුරට හිමිවිය යුතු බව සනාථ කළේය. පසු කාලයේ දී මෙම තම්මිට සූරිය බණ්ඩාර ෆ්‍රැන්සිස්කු බරෙත්තු නමින් බෞතීස්ම ලැබුවේය. මොහු වීදිය බණ්ඩාරගේ බාල සොහොයුරාය. වීදිය බණ්ඩාර, බුවනෙකබා රජුගේ දියණිය වූ සමුද්‍ර දේවියගේ සැමියා වූ අතර ඔවුන් දෙදෙනාගේ පුතා වූයේ ධර්මපාල කුමරුය.

එසේම අන්තෝනියෝ පෙරෙයිරා නම් තෝල්කයාට හා ඔහුගේ පරපුරට කෝට්ටේ මහවාසල තෝල්ක මුදලි පදවිය හිමිවිය යුතු බවද මෙම ආඥාවෙන් කියවිණි.

1543 :

ප්‍රැන්සිස්කන් මිෂනාරි කණ්ඩායමක් කොළඹට පැමිණෙයි.

කතෝලික ආගම ප්‍රචාරය කිරීම සඳහා පල්ලි ඉදිකිරීම සඳහාත් මෙම පිරිසට බුවනෙකබා රජුගේ අවසරය ලැබී තිබිණි. සිංහලය තුළ ලැබුණු මේ "ආගමික නිදහස" සමකාලීන යුරෝපීය ආදී රටවල නොතිබුණු තත්ත්වයකි. පෘතුගිසීන්, සිංහලය තුළ මෙසේ තම බලාධිකාරිය යොදා කතෝලික ආගම පැතුරුවා හැරියද පෘතුගාලයේ ස්වදේශිකාගමට විරුද්ධ වූවන් වෙනත් ආගම් පැතිරවීම මරණ දඬුවම පනවන වරදක් විය.

පැමිණි ක්‍රිස්තියානි මිෂනාරි ප්‍රචාරක පිරිස ආගම දේශනා කරන්නන්ගේ කාර්යභාරය නොව කතෝලික ආගමට බෞද්ධයන් බඳවා ගැනීමේ ආක්‍රමණකාරී කටයුත්තේ යෙදිනි. මෙම පිරිසේ ප්‍රධානියා වූයේ ජෝආඕඩී විල්ලා ඩී කොන්ඩෙ පාදිලිතුමාය.

**1545 නොවැ. 12 :**

ක්‍රිස්තියානිකාරයකු වීම මට නම් කළ නොහැක්කකි. මට මේ අදහන බුදු හාමුදුරුවන් ගැන මිස අන් දෙවියකු ගැන විශ්වාස කළ නොහැක" යනුවෙන් සඳහන් කරමින් ගෝව ප්‍රතිරාජයා වෙත බුවනෙකබා රජු විසින් ලිපියක් යවයි.

**1545 නොවැම්බර් :**

මායාදුන්නේ සේනාව අගමැති වූ ආර්ය ප්‍රමුඛ ජනතාව උඩරටට පහරදෙයි.

**1546 පෙබරවාරි 15 :**

වැනිදා කොච්චින් නුවරින් පිටත් වූ මෙම පිරිස ජයවීරගේ ආධාරයට පැමිණි හමුදා විය. නමුත් පැවැති කාලගුණික තත්ත්වය හා බාධක හේතුවෙන් මොවුන්ට උඩරට සේනාව සමග එක්වන්නට නොහැකි විය.

**1546 මාර්තු 9 :**

පෘතුගීසි ආධාර ලබා ගැනීමේ අරමුණ පෙරදැරිව ජයවීර රහසේම කතෝලිකාගම වැළඳ ගනියි.

**1546 අප්‍රේල් :**

අන්ද්‍රාදි ද සූසා ප්‍රමුඛ පෘතුගීසි බලකායක් උඩරටට ළඟා වෙයි.

**1547 :**

කොළඹ පෘතුගීසි ප්‍රධානි අන්තෝනියෝ බරෙන්තු භටයන් සියයක් හා කතෝලික මිෂනාරි පූජකයන් කිහිපදෙනකු උඩරට වෙත ළඟා වෙයි.

නමුත් මේ වන විට තමනට යුද ආධාර අවශ්‍ය මොහොත පසු වූ බව කල්පනා කළ ජයවීර පෘතුගීසීන්ට කොන්දේසි පනවන්නට විය. මායාදුන්නේගේ රාජධානිය හා යාපා පටුන තෙක් මුළු දිවයිනම තමාට පෘතුගීසීන් ලබා දුන්නොත් උඩරට කතෝලික මිෂනාරි කටයුතු සඳහා ඉඩ ලබා දෙන බව ජයවීර පැවැසීය. මේ අවස්ථාවේ දී බුවනෙකබා රජු විසින් ජයවීර වෙත පණිවුඩයක් එවා තිබිණි. පෘතුගීසීන් උඩරටින් පළවා නොහැරියහොත් උඩරට සමග තමන්ගේ සුහදතාව කෙළවර වන බව ඉන් කියවිණි. මේ සියල්ලේ අවසාන ප්‍රතිඵලය වූයේ නැගෙනහිර වෙරළෙහි පිහිටි මඩකලපුව තොටමුණ ඔස්සේ සිය සීමාවෙන් පිටවන ලෙස ජයවීර පෘතුගීසීන්ට දන්වා සිටීමය.

ජයවීර කෙරෙහි කලකිරී සිටි පෘතුගීසි සේනානායක බරෙන්තු මේ දන්වා සිටීමත් සමග සිය ගමන් මලු පුළුස්සා, සිය කාලතුවක්කු හමුදාව හැරදා සත් කෝරළය ඔස්සේ බටහිරින් වූ කෙටි මගකින් වෙරළට පසු බැස්සේය.

මනෝජ් අබයදීර